# මෛත්‍රී භාවනාව (පාළි - සිංහල)

- **අහං අවේරෝ හෝමි** - මම වෛර නැත්තෙක් වෙම්වා..
- **අබ්‍යාපජ්ඣෝ හෝමි** -තරහා නැත්තෙක් වෙම්වා..
- **අනීඝෝ හෝමි** - දුක් පීඩා නැත්තෙක් වෙම්වා..
- **සුඛී අත්තානං පරිහරාමි** - සුවසේ ජීවත් වෙම්වා..
- **අහං විය මය්හං** - මා මෙන් ම මාගේ,
- **ආචරි උපජ්ඣායා** - ආචාර්ය උපාධ්‍යායන් වහන්සේලා ද,
- **මාතා පිතරෝ** - මව් පියවරු ද,
- **හිත සත්තා** - හිතවත් සත්වයෝ ද,
- **මජ්ඣත්තික සත්තා** - මැදහත් සත්වයෝ ද,
- **වේරිසත්තා** - වෛරී සත්වයෝ ද,
- **අවේරා හොන්තු** - වෛර නැත්තෝ වෙත්වා,
- **අබ්‍යාපජ්ඣා හොන්තු** - තරහා නැත්තෝ වෙත්වා..
- **අනීඝා හොන්තු** - දුක්පීඩා නැත්තෝ වෙත්වා..
- **සුඛී අත්තානං පරිහරන්තු** - සුවසේ ජීවත් වෙත්වා..
- **දුක්ඛා මුච්චන්තු** - දුකින් මිදෙත්වා..
- **යථා ලද්ධසම්පත්තිතෝ** - ලද සම්පත් වලින්
- **මා විගච්ඡන්තු** - නො පිරිහෙත්වා..
- **කම්මස්සකා** - කර්මය ස්වකීය දෙය කරගෙන ඇත්තාහු ය.
- **ඉමස්මිං විහාරේ** - මේ විහාරයේ සිටින,
- **ඉමස්මිං ගෝචර ගාමේ** - මේ ගොදුරු ගමෙහි සිටින,
- **ඉමස්මිං නගරේ** - මේ නගරයේ සිටින,
- **ඉමස්මිං දීපේ** – මේ රටේ සිටින
- **ඉමස්මිං ලංකා දීපේ** - මේ ලංකාදීපයේ සිටින,
- **ඉමස්මිං ජම්බු දීපේ** - මේ දඹදිව් තලයේ සිටින,
- **ඉමස්මිං චක්කවාළේ** - මේ සක්වලෙහි සිටින,
- **ඉස්සර ජනා** - ඉසුරුමත් ජනයෝ,
- **සීමට්ඨක දේවතා** - සීමා වාසී දෙවිවරු,
- **සබ්බේ සත්තා** - සියලු සත්වයෝ,
- **අවේරා හොන්තු** - වෛර නැත්තෝ වෙත්වා,
- **අබ්‍යාපජ්ඣා හොන්තු** - තරහ නැත්තෝ වෙත්වා..
- **අනීඝා හොන්තු** - දුක්පීඩා නැත්තෝ වෙත්වා..
- **සුඛී අත්තානං පරිහරන්තු** - සුවසේ ජීවත් වෙත්වා..
- **දුක්ඛා මුච්චන්තු** - දුකින් මිදෙත්වා..
- **යථා ලද්ධසම්පත්තිතෝ** - ලද සම්පත් වලින්
- **මා විගච්ඡන්තු** - නො පිරිහෙත්වා..
- **කම්මස්සකා** - කර්මය ස්වකීය දෙය කරගෙන ඇත්තාහු ය.

- **පුරත්ථිමාය දිසාය** - නැගෙනහිර දිශාවේ සිටින,
- **දක්ඛිණාය දිසාය** - දකුණු දිශාවේ සිටින,
- **පච්ඡිමාය දිසාය** - බටහිර දිශාවේ සිටින,
- **උත්තරාය දිසාය** - උතුරු දිශාවේ සිටින,
- **පුරත්ථිමාය අනුදිසාය** - නැගෙනහිර අනු දිශාවේ සිටින,
- **දක්ඛිණාය අනුදිසාය** - දකුණු අනු දිශාවේ සිටින,
- **පච්ඡිමාය අනුදිසාය** - බටහිර අනු දිශාවේ සිටින,
- **උත්තරාය අනුදිසාය** - උතුරු අනු දිශාවේ සිටින,
- **හෙට්ඨිමාය දිසාය** - යට දිශාවේ සිටින,
- **උපරිමාය දිසාය** - උඩ දිශාවේ සිටින,
- **සබ්බේ සත්තා** - සියලු සත්වයෝ,
- **සබ්බේ පාණා** - සියලු ප්‍රාණීන් ද,
- **සබ්බේ භූතා** - සියලු භූතයෝ ද,
- **සබ්බේ පුග්ගලා** - සියලු පුද්ගලයෝ ද,
- **සබ්බේ අත්තභාවපරියාපණ්ණා** - ආත්මභාව ලබා ගත් සියලු සත්වයෝ,
- **සබ්බා ඉත්ථියෝ** - සියලු ස්ත්‍රීන්,
- **සබ්බේ පුරිසා** - සියලු පුරුෂයෝ,
- **සබ්බේ අරියා** - සියලු ආර්යයෝ,
- **සබ්බේ අනරියා** - සියලු අනාර්යයෝ,
- **සබ්බේ දේවා** - සියලු දෙවියෝ,
- **සබ්බේ මනුස්සා** - සියලු මනුෂ්‍යයෝ,
- **සබ්බේ අමනුස්සා** - සියලු අමනුෂ්‍යයෝ,
- **සබ්බේ විනිපාතිකා** - සියලු අපායවාසී සත්වයෝ,
- **අවේරා හොන්තු** - වෛර නැත්තෝ වෙත්වා,
- **අබ්‍යාපජ්ඣා හොන්තු** - තරහ නැත්තෝ වෙත්වා..
- **අනීඝා හොන්තු** - දුක්පීඩා නැත්තෝ වෙත්වා..
- **සුඛී අත්තානං පරිහරන්තු** - සුවසේ ජීවත් වෙත්වා..
- **දුක්ඛා මුච්චන්තු** - දුකින් මිදෙත්වා..
- **යථා ලද්ධසම්පත්තිතෝ** - ලද සම්පත් වලින්
- **මා විගච්ඡන්තු** - නො පිරිහෙත්වා..
- **කම්මස්සකා** - කර්මය ස්වකීය දෙය කරගෙන ඇත්තාහු ය.
- **සබ්බේ සත්තා සුඛිනෝ භවන්තු** - සියලු සත්වයෝ සුවපත් වෙත්වා...!
- **සබ්බේ සත්තා සුඛිනෝ භවන්තු** - සියලු සත්වයෝ සුවපත් වෙත්වා...!!
- **සබ්බේ සත්තා සුඛිනෝ භවන්තු** - සියලු සත්වයෝ සුවපත් වෙත්වා...!!!

Mahamevnawa Buddhist Monastery,
Bierbrauer weg 8,
63071 Offenbach am main,
Germany.

Tel:- 0049 69 94 94 46 14
E mail :- info@mahamevnawa-germany.de
Web site :- www.mahamevnawa-germany.de